# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/36 - 2016 මාර්තු මස 30 වැනි බදාදා - 2016.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී 63/51(II)

**ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල**

(284 වැනි අධිකාරය වූ) දුම්රිය නිළැ'ඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥපනතේ 16 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා දුම්රිය නිළැ'ඳුම් සේවා ආර්ථසාධක අරමුදල නම් වූ සංස්ථාව විසින් සාදනු ලැබ, ඉහත කී වගන්තිය මඟින් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඔහු විසින් ස්ථිර කරනු ලැබුවා වූ රීති.

වැඩ බලන ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

කලින් කල සංශෝධිත අංක 1833/26 සහ 2013, ඔක්තෝබර් මස 24 වැනි දින දරන අති විශෙෂ *ගැසට් පත්‍රය* මඟින් අවසන් වරට සංශෝධිත 1984 ජූලි මස 6 වැනි දින අංක 305 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රීති, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

1. 5 වැනි රීතියේ 1 වැනි ඡේදයේ ''රුපියල් සියයක් '' යන වචන වෙනුවට ''රුපියල් පන් සියයක් '' යන වචන ආදේශ කිරීමෙන් -

2. 15 වන රීතියේ -

*(අ)* 1 වැනි ඡේදයේ (අ) අනුඡේදයේ ''රුපියල් විසි දහසක (රු. 20,000)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''රුපියල් තිස් දහසක (රු. 30,000)'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

*(ආ)* (5) වැනි ඡේදයේ *(අ)* අනුඡේදයේ ''සියයට දහයක් '' යන වචන වෙනුවට ''සියයට හයක් '' යන වචන ආදේශ කිරීමෙන්.


1A - G 23232— 21 (2016/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. 19 වන රීතියේ (8) වන ඡේදයේ ''සියයට දහයක් '' යන වචන වෙනුවට ''සියයට හයක් '' යන වචන ආදේශ කිරීමෙන්.

4. 21 වන රීතිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :-

''උත්සව ණය

21. (1) *(අ)* සාමාජිකයකු වශයෙන් අවුරුදු එකක කාලයක් සම්පූර්ණ කොට ඇති උත්සව ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් සාමාජිකයකු අවුරුද්දකට වරක් රුපියල් දස දහසක (රු. 10,000) එවැනි ණය මුදලකට හිමිකම් ලබන්නේ ය. ඉහත කී උත්සව ණය මුදල ලබාගත් යම් සාමාජිකයකු එම මුදල සියයට විස්සක් (20%) වාර්ෂික පොලියක් සමඟ රුපියල් එක් දහස් දෙසියයක් (රු. 1,200)ක් වූ වාරික දහයකින් ගෙවනු ලැබිය යුතු ය.

*(ආ)* යම් සාමාජිකයකුට කලින් ලබා ගන්නා ලද යම් උත්සව ණය මුදලක් වෙතොත්, එකී සාමාජිකයා විසින් එය සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් කරනු ලබන තෙක්, ඔහු උත්සව ණය මුදලක් ලබා ගැනීමට හිමිකම නොලබන්නේ ය.

සහන ණය

21.(2) (අ) සාමාජිකයෙකු වශයෙන් අවුරුදු එකක කාලයක් සම්පූර්ණ කොට ඇති යම් සාමාජිකයකු පහත උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ඔහුගේ සාමාජිකත්වය දරන කාලසීමාවට අනුරූප වන යම් ප්‍රමාණයක සහන ණය මුදලකට හිමිකම් ලබන්නේ ය.

**උපලේඛනය**

| *අංක* | *සාමාජිකත්ව කාලය (අවුරුදු වලින්)* | *ණය මුදල (රුපියල් වලින්)* |
|---|---|---|
| 1 | 01-10 | 3,500/- |
| 2 | 10ට වැඩි | 5,000/- |

*(ආ)* සාමාජිකයකු වශයෙන් අවුරුදු එකක කාලයක් සම්පූර්ණකොට ඇති නමුත්, අවුරුදු දහයක කාලයක් සම්පූර්ණකර නැති යම් සාමාජිකයකු රුපියල් තුන් දහස් පන්සියයක (රු. 3,500) සහන ණය මුදලක් සඳහා හිමිකම් ලබන්නේ ය. සාමාජිකයකු වශයෙන් අවුරුදු දහසයක වැඩි කාලයක් සම්පූර්ණකර ඇති යම් සාමාජිකයෙකු රුපියල් පන්දහසක (රු. 5,000) සහන ණය මුදලක් සඳහා හිමකම් ලබන්නේ ය.

*(ඇ)* පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ආකාරයට මෙම රීතිය යටතේ ප්‍රදානය කරන ලද සහන ණය මුදලක් සියයට දහසයක (16%) ක අනුපාතිකයට වූ පොලිය ද සහිතව මාසික වාරික හයකින් හෝ මාසික වාරික දොළහකින් අයකර ගනු ලැබිය යුතු ය.

**උපලේඛනය**

| *අංකය* | *ණය මුදල (රුපියල් වලින්* | *මාස හයකින් (වාරික හතරකින්)* | *පොලිය (16%ක අනුපාති කයකට)* | *මාස දොළහකින් (වාරික හයකින්)* | *පොලිය (16%ක අනුපාති කයකට* |
|---|---|---|---|---|---|
| 1 | 3,500 | 875 | 70 | 350 | 56 |
| 2 | 5,000 | 1,250 | 100 | 500 | 80 |

*(ඈ)* යම් සාමාජිකයකුට කලින් ලබා දෙන ලද සහන ණය මුදලක් වෙතොත්, එය එකී සාමාජිකයා විසින් සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් කරනු ලබන තෙක් ඔහු සහන ණය මුදකට හිමිකම් නොලබන්නේ ය.

21. (3) එවැනි ණය මුදලක් සඳහා වූ යම් ඉල්ලීමක් ශ්‍රී ලංකා දුම්රිය නිළැ'දුම් සේවා ආර්ථසාධක අරමුදලෙහි ලේකම් සහ භාණ්ඩාගාරික වෙත තත් කාර්යය සඳහා සංස්ථා කාර්යාලය මගින් සපයා ඇති ආකෘති පත්‍රයකින් ඉදිරිපත් කළ යුතු අතර, ණය ඉල්ලා සිටීමට හේතු සඳහන් කරන ලද ප්‍රකාශයක් ද සාමාජිකයාගේ පාස් පොත ද ඒ සමඟ ලබා දිය යුතු ය.

21. (4) නියමිත වටිනාකමින් යුතු වලංගු මුද්දරයක් මත අත්සන් යොදා සාක්ෂිකරුවන් දෙදෙනෙකුගේ සාක්ෂි සහිතව ඉල්ලුම්පත්‍රයෙහි පසු පිටුවෙහි මුද්‍රණය කර ඇති කුවිතාන්සිය සම්පූර්ණ කළ යුතු ය. සංස්ථාවේ චෙක්පත් සඳහා අත්සන් තබන නිලධරයන් එවැනි යම් ණය ඉල්ලුම්පත්‍රයක් සඳහා සාක්ෂිකරුවන් වශයෙන් අත්සන් තැබීමට හිමිකම් නොලබන්නේ ය.

21. (5) යථා පරිදි සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම්පත්‍රය සමඟ කුවිතාන්සිය ලැබුණු විට, ඉල්ලුම් කරන ලද ණය මුදල හෝ ගෙවිය හැකි ණය මුදල සඳහා චෙක්පතක් ද, හර සහ බැර සටහන් පිළිබඳ විස්තර අඩංගු පාස් පොත ද දින තුනක් ඇතුළත සාමාජිකයා වෙත යැවිය යුතු ය.

21. (6) චෙක්පත සමඟ පාස් පොත ද ලැබුණු විට, සාමාජිකයා විසින් එහි සටහන් පරීක්ෂා කර බලා යම් සාවද්‍ය සටහනක් වේ නම්, ඒ බව වහාම ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ලිඛිතව දන්වා නිවැරදි කරවා ගත යුතු ය. පාස් පොතේ කිසිදු සටහනක් තැබීම හෝ කවර ආකාරයකින් හෝ එවකට තබා ඇති යම් සටහනක් වෙනස් කිරීම සාමාජිකයාට සම්පූර්ණයෙන් ම තහනම් වන අතර, එසේ කරන ලද බව සොයා ගනු ලැබුවහොත් එකී සාමාජිකයාගේ සාමාජිකත්වය නතර කිරීම, අත්හිටුවීම හෝ එකී සාමාජිකයා සාමාජිකත්වයෙන් නෙරපීම හෝ විනයානුකූලව කටයුතු කිරීම සඳහා එය දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට පාලන කමිටුවට බලය ඇත්තේ ය.

5. 22 වන රීතිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :-

"විශේෂ ණය

22. (1) සාමාජිකයකු වශයෙන් අවුරුදු එකක කාලයක් සම්පූර්ණ කොට ඇති යම් සාමාජිකයකු, පහත දක්වා ඇති උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ඔහුගේ සාමාජිකත්වය දරන කාලසීමාවට අනුරූප වන යම් ප්‍රමාණයක විශේෂ ණය මුදලකට හිමිකම් ලබන්නේ ය.

**උපලේඛනය**

| *අංකය* | *සාමාජිකත්වය කාලය (අවුරුදුවලින්)* | *ණය මුදල (රුපියල් වලින්)* |
|---|---|---|
| 1 | 01-03 | 10,000 |
| 2 | 03-05 | 20,000 |
| 3 | 05-10 | 30,000 |
| 4 | 10-15 | 40,000 |
| 5 | 15-20 | 60,000 |
| 6 | 20ට වැඩි | 80,000 |

22. (2) මෙම රීතිය යටතේ විශේෂ ණයක් ඉල්ලුම් කරන යම් සාමාජිකයකු-

*(අ)* වයස අවුරුදු පනස් හත නොඉක්මවිය යුතු ය.

*(ආ)* සංස්ථා කාර්යාලයෙන් ලබා ගත යුතු වන විශේෂ ණය ඉල්ලුම් පත්‍රයකින් ඉල්ලීම කළ යුතු ය.

*(ඇ)* ඉල්ලුම් පත්‍රය මගින් නියමකොට ඇති සියලු තොරතුරු සැපයිය යුතු ය.

*(ඈ)* යථා පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සංස්ථාවේ ලේකම් සහ භාණ්ඩාගාරිකවරයාට භාර දිය යුතු ය.

22. (3) (22) වන රීතියේ (2) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ ණය මුදලක් ලබා ගැනීමට සුදුසුකම් නොලබන යම් සාමාජිකයකුට පාලන කමිටුවේ ලිඛිත අනුමතයට යටත්ව විශ්‍රාම යන දිනට ගෙවා අවසන් කළ යුතු රුපියල් හතලිස් දහසක (රු. 40,000) විශේෂ ණය මුදලක් ලබා දිය හැකි ය. මේ සම්බන්ධව පාලන කමිටුව ගනු ලබන තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

22. (4) විශේෂ ණය මුදලක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම් පත්‍රයට අමුණා ඇති ඇප බැඳුම්කරය සෑම සාමාජිකයකු විසින් ම යථා පරිදි සම්පූර්ණ කළ යුතු අතර එම ඇප බැඳුම්කරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම ණය මුදල ගෙවා නිම කිරීමට භාරගත යුතු ය. යම් සාමාජිකයකු විසින් ණය වාරික ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එසේ ගෙවීම පැහැර හරින ලද වාරිකය සහ ඒ සඳහා ගෙවීමට නියමිත පොලියට සමාන රුපියල් ප්‍රමාණයක් එකී සාමාජිකයාගේ වැටුපෙන් අඩු කර ගැනීමට මෙම රීතිය යටතේ සංස්ථාවට බලය පැවරෙන්නේ ය.

22. (5) යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය 8 වන රීතියේ (2) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ අත්හිටුවනු ලබන අවස්ථාවක, එම සාමාජිකයා විසින් විශේෂ ණය මුදලෙන් නොගෙවා ඉතිරි වී ඇති මුදල් ප්‍රමාණය එසේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබූ දින සිට නොකඩවා තුන් මසක් ඇතුළත එම සාමාජිකයාගේ තැන්පත් මුදලින්, පාරිතෝෂිකයෙන් හෝ වෙනත් යම් හිමිකමකින් හිලව්කර ගැනීම සඳහා ඇප බැඳුම්කරය මත ඔහුගේ අත්සන තැබීමෙන් එකඟ විය යුතු ය.

22. (6) ලේකම් සහ භාණ්ඩාගාරික විසින්, මෙම රීතිය යටතේ විශේෂ ණය මුදලක් සඳහා ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් අනතුරුව, ඉල්ලුම්කරු ඉදිරියෙන් එම ඉල්ලුම්පත්‍රය නිල මුද්‍රා තැබීම කළ යුතු අතර, ඉල්ලුම්කරු වෙත අනුක්‍රමික අංකයක් සහිත රිසට්පතක් නිකුත් කළ යුතු ය.

22. (7) සංස්ථාව විසින් ඉල්ලුම්පත්‍රයෙහි අනුක්‍රමික අංකය සහ අරමුදල් පවතින ප්‍රමාණය අනුව, මෙම රීතිය යටතේ යම් සාමාජිකයකුට ණය ගෙවීම කරනු ලැබිය යුතු ය.

22. (8) මේ රීතිය යටතේ යම් සාමාජිකයකුට ප්‍රදානය කරන ලද විශේෂ ණය මුදලක් පහත උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයට වාරික මගින් මාස 6, 12, 18, 24 හෝ 36 කින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි සාමාජිකයකු විසින් මේ රීතිය යටතේ ලබා ගත් ණයක් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කරන තුරු මෙම රීතිය යටතේ නැවත ණයක් ලබා ගැනීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

**උපලේඛනය**

| අංකය | ණය මුදල රු. | මාස හයකින් (වාරික 4) රු. | පොළිය (16% අනුපාතයට) රු. | මාස දොළහකින් (වාරික 10) රු. | පොළිය (16% අනුපාතයට) රු. | මාස දහ අටකින් (වාරික 16) රු. | පොළිය (16% අනුපාතයට) රු. | මාස විසි හතරකින් (වාරික 22) | පොළිය (16% අනුපාතයට) රු. | මාස තිස් හයකින් (වාරික 34) | පොළිය (16% අනුපාතයට) රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 10,000 | 2,500 | 200 | 1000 | 160 | 625 | 150 | 550 xl<br>450x21 | 145 | | |
| 2 | 20,000 | 5,000 | 400 | 2,000 | 320 | 1,250 | 300 | 1100 xl<br>900 x21 | 291 | 530 xl<br>590 x 33 | 282 |
| 3 | 30,000 | 7,500 | 600 | 3,000 | 480 | 1,875 | 450 | 1335 xl<br>1365 x21 | 436 | 960 x 1<br>880 x 33 | 423 |
| 4 | 40,000 | 10,000 | 800 | 4,000 | 640 | 2,500 | 600 | 1780 xl<br>1820 x21 | 581 | 1060 xl<br>1180 x 33 | 564 |
| 5 | 60,000 | 15,000 | 1200 | 6,000 | 960 | 3,750 | 900 | 2670 xl<br>2730 x 21 | 872 | 1755 xl<br>1765 x 33 | 847 |
| 6 | 80,000 | 20,000 | 1600 | 8,000 | 1280 | 5,000 | 1200 | 3665 xl<br>3635 x21 | 1163 | 2450 xl<br>2350 x 33 | 1129 |

6. 23 වන රීතිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :-

''විශේෂ ණය අය කර ගැනීම.

23. (1) මෙම රීතිය යටතේ ප්‍රදනය කරන ලද විශේෂ ණය මුදලක් ගෙවා නිම කළ යුතු වාරික ගණන 22 වන රීතියේ (5) වන ඡේදයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති වාරික ගණන නොඉක්මවිය යුතු ය.

එසේ වුව ද, 22 වන රීතියේ (5) වන ඡේදයේ උපලේඛනය ප්‍රකාරව ණය මුදල ගෙවා නිම කිරීමට යම් සාමාජිකයෙකු විසින් සිය කැමැත්ත දක්වමින් ඉල්ලීමක්කොට ඇති අවස්ථාවක, ලේකම් සහ භාණ්ඩාගාරික විසින් වාරික සංඛ්‍යාව අඩු කළ හැකිය. එසේ වුව ද, කවර හෝ ආකාරයකින් වාරික සංඛ්‍යාව වැඩි නොකළ යුතු ය. යම් සාමාජිකයෙකු විසින් ණය වාරික ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඉතිරිව ඇති වාරික මත, දණ්ඩන මුදලක් වශයෙන් 3%ක පොළියක් අයකර ගනු ලැබිය යුතු ය.

හිඟ මුදල්.

23. (2) (අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ යෙදී සිටින හෝ එයින් සේවයෙන් පහ කරනු ලැබූ යම් සාමාජිකයෙකුගෙන් ඒකාබද්ධ අරමුදලට යම් හිඟ මුදලක් අය විය යුතු අවස්ථාවක, අදළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියා විසින්, 6 වන රීතියේ (1) වන සහ (2) වන ඡේද ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලේ ලේකම් සහ භාණ්ඩාගාරික විසින් ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කරනු ලැබූ විට, අදළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන්ගෙන් එම සාමාජිකයාට ලැබීමට ඇති යම් මුදලකින් එම සියලු හිඟ මුදල් ලබා ගැනීමට මේ රීතිය යටතේ බලය පැවරෙන්නේ ය.

(ආ) එකී දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ එවැනි සාමාජිකයකුගේ බැරට කිසිදු මුදලක් නොමැති නම්, එම මුදල නීතිමය ක්‍රියාවලියක් මගින් අයකර ගැනීමට සංස්ථාවට බලය තිබිය යුතු ය.''

7. 25 වන රීතියේ ''රුපියල් දෙදහස් පන්සීයයකට (රු. 2,500/-) නොවැඩි මුදලක් '' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''රුපියල් පන් දහසකට (රු. 5,000/-) නොවැඩි මුදලක් '' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,

8. 26 වන රීතියේ (ආ) ඡේදයේ '' සියයට දහයක (10%) යන වචන සහ ඉලක්කම් වෙනුවට ''සියයට හයක (6%) යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ''

9. 33 වන රීතියේ (10) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන (11) වන අලුත් ඡේදය එකතු කිරීමෙන්,

''33. (11) පාලන කමිටුවේ සාමාජිකයන්, රුපියල් එක් දහස් දෙසීයක් (රු. 1,200/-) සහ ඒ මත වූ සියයට විස්සක (20%) අනුපාතයට වූ පොළියක් ද සමග මාසික වාරික දහයකින් ආපසු ගෙවනු ලැබිය යුතු රුපියල් දස දහසක (රු. 10,000) ආපදා ණයක් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ය. යම් පාලන කමිටු සාමාජිකයකු ණය වාරික ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එකී වාරිකය සහ ඒ මත වන පොළියට සමාන රුපියල් ප්‍රමාණයක් එකී සාමාජිකයාගේ වැටුපෙන් අඩුකර ගැනීමට සංස්ථාවට බලය තිබිය යුතු ය.''.

10. 39 වන රීතියෙහි (1) වන ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන් :-

"සභාපතිගේ ප්‍රසාද දීමනා සහ කාරක සභා ගමන් ගාස්තු

39. (1) කාරක සභාවේ ගමන් ගාස්තුවලට අමතරව, සංස්ථාවේ සභාපතිවරයාට පමණක් සංවත්සර මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඔහුගේ නිල කාලය තුළ දී, සිය මාසික මූලික වැටුපෙන් සියයට විසි පහක් (25%) වූ ප්‍රසාද දීමනාවක් ලැබීමට හිමිකම ඇත්තේ ය. එසේ වුව ද, එම ප්‍රසාද දීමනාවේ වටිනාකම රුපියල් පන්දහස (රු. 5,000/-) නොඉක්ම විය යුතු අතර මෙයට අමතරව වෙනත් යම් දීමනාවක් ලබා ගැනීම සඳහා හිමිකමක් නොලැබිය යුතු ය.''.

04-643

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.